මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/CIR/2025/ Trainees ALW

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025.10.01

කළමනාකරණ සේවා චක්‍රලේඛ: 11/2025

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ

සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

## ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වලට අනුයුක්ත කිරීම

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වලට ප්‍රායෝගික පුහුණුව සඳහා අනුයුක්ත කරන පුහුණුලාභීන් හට දෛනිකව දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයක් අනුව සිදු කිරීම අරමුණු කර ගනිමින් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුගතව 2025.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කෙරේ.

02. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාසල්වල ක්‍රියාත්මක වන පරිගණක විද්‍යාගාර , කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථාන, පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන වැනි රජයේ පුහුණු ආයතනවල පාඨමාලා හදාරා සුදුසුකම් ලත් සිසු සිසුවියන් වෙනුවෙන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයක හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් උපාධි පාඨමාලා හදාරන දෙවන, තුන්වන හා හතරවන වසරවල උපාධි අපේක්ෂක/ අපේක්ෂිකාවන් වෙනුවෙන් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමේ බලය සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට , පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට පවරනු ලැබේ.

03. උපාධිධාරීන් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන යටතේ අභ්‍යාසලාභී පුහුණුවට ඇතුළත් කර නොගැනීමට සහ/ හෝ කිසිම හේතුවක් මත පුහුණු වන අභ්‍යාසලාභීන් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු පුහුණුවන්නන් ලෙස රඳවා නොගැනීමට ක්‍රියා කළ යුතුය.

04. පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව උපරිමය 25 ක් හෝ සමස්ත සේවක සංඛ්‍යාවෙන් 10% යන දෙකෙන් අවම සංඛ්‍යාවට සීමා කළ යුතු අතර සේවා අවශ්‍යතාවය මත එම සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවල දී මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගෙන කටයුතු කළ හැකි වේ.

05. ඒ අනුව ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අදහස් කරන සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර පිටපත් 02 කින් යුක්තව සම්පූර්ණ කොට ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමග අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇත්තේ නම් පමණක් පුහුණුලාභියෙකුට දෛනිකව රු. 1,000/- ක දීමනාවක් ගෙවිය හැකි අතර, ඊට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය. එමෙන්ම මෙම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අතිරේක මුදල් ප්‍රතිපාදන නොඉල්ලීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

07. සියලුම ප්‍රායෝගික පුහුණුවීම් අනිවාර්යෙන්ම මාස 06 කට සීමා කළ යුතු අතර පාඨමාලාවේ නිර්දේශිත ප්‍රායෝගික පුහුණු කාලසීමාව මාස 06 කට වඩා වැඩි වන කල්හි එම පුහුණුව ද පාඨමාලාවෙහි නිර්දේශිත පුහුණු කාලසීමාව නොඉක්ම විය යුතුය.

08. පුහුණුවන්නන්, පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කිරීමේ දී ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ නිශ්චිත පුහුණුවීම් සිදු යුතු කළ වේ.

09. ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවකයින් සඳහා හිමි කිසිදු වරප්‍රසාදයක් හිමි නොවන බව පැහැදිලිවම ලිඛිතව දැනුම්දි ය යුතුය. තව ද ප්‍රායෝගික පුහුණුව සඳහා ආවරණ අනුමැතිය ලබා දීමක් ද නොකළ යුතුය.

10. මෙම ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීමේ දී අදාළ ආයතන හෝ පුහුණුව ලබන්නා සමඟ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 65 වගන්තියේ විධිවිධාන අනුව එළඹිය යුතු ගිවිසුමකට හැර වෙනත් කිසිදු ගිවිසුමකට ඇතුළත් නොවිය යුතුය.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

<u>ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා අයදුම්පත්‍රය</u>

මාගේ අංකය:- ..........................
දිනය :- ..........................

අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්

I කොටස

01.
01:(i)කාර්යාලය : ........................................................
01:(ii) පුහුණුවට යොමු කරන ආයතනයේ නම : ........................................................
01:(iii) යොමු අංකය හා දිනය : ........................................................

02. පුහුණුව ලබාදීමට අදහස් කරන අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර :

| පුහුණුව ලබන්නාගේ නම (1) | විෂයය (2) | ආරම්භක දිනය (3) | අවසාන දිනය (4) | කාලය (මාස) (5) |
|---|---|---|---|---|
| I | | | | |
| II | | | | |
| III | | | | |
| IV | | | | |
| V | | | | |

03. ඉහත නම් සඳහන් ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට ගෙවීම සඳහා ප්‍රතිපාදන ඇත/නැත.

ඉහත නම් සඳහන් පුහුණුවන්නන්ට එහි සඳහන් කාලසීමාව සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. පුහුණුව ලබන දිනකට රු. 1000/-(රුපියල් දාහක) දීමනාවක් ලබාදිය හැක/නොහැක.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන: ........................................................
නම : ........................................................
තනතුර : ........................................................

II කොටස

මාගේ අංකය:- ..................................
දිනය :- ..................................

පළමුවන කොටසේ නම් සඳහන් පුහුණුවන්නන්ට ඊට ඉදිරියෙන් සඳහන් හය මසක (6) / අවුරුදු ........... කාලය සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම අනුමත කරමි/නොකරමි. පුහුණුව ලබන එක් දිනකට රු.1000/-(රුපියල් දාහක්) බැගින් ගෙවීම අනුමත කරමි/නොකරමි.

..................................................................
අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්